**ජාතික ක්‍රීඩා අරමුදල - 2014**

------------------------------

ජාතික ක්‍රීඩා අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම සහ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------

මෙම වාර්තාවෙ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය රු.2,611,398 කින් වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය හා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රීඩා අරමුදලට ලැබුණු ප්‍රදානයන් රු.15,000,000 ක් විශේෂ අත්තිකාරම් ගිණුමට බැර කිරීම හේතුවෙන් විශේෂ අත්තිකාරම් ගිණුමේ පැවති රු.15,000,000 ක ශේෂය ශුන්‍ය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ආයෝජන ශේෂය රු.169,288,291 ක් වුවද ශේෂ සනාථ අනුව එම ශේෂය රු.169,002,530 ක් වුයෙන් රු.285,761 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල සඳහන් පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට හෝ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත්නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ජාතික ක්‍රීඩා උළෙලේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට ත්‍යාග මුදල්. | 5,691,500 | ත්‍යාග මුදල් ලාභීන්ගේ විස්තර. |
| (ආ) | ක්‍රිකට් තරඟාවලි වියදම්. | 347,600 | බිල්පත් හා වියදම් වාර්තා. |
| (ඇ) | රෝයල් සිටි ශ්‍රී ලංකා ග්‍රන්ථ 5 ක් මිලදී ගැනීම. | 45,000 | භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් වලට අදාල ලේඛන. |
| (ඈ) | පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුවට ක්‍රීඩා පොත් 100 ක් මිලදී ගැනීම. | 1,128,234 | භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් වලට අදාල ලේඛන. |

**2.3 නීතී රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1973 අංක 25 දරන ජාතික ක්‍රීඩා පනත | |
| | (i) 4 වන වගන්තිය | සමාලෝචිත වර්ෂයේ පැවැත්වූ ජාතික ක්‍රීඩා සභාවේ රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් එහි සාමාජිකයන්ට දීමනා ලෙස රු. 98,000 ක් පනතට පටහැනිව ගෙවා තිබුණි. |
| | (ii) 25(2) වගන්තිය | එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කළ යුතු වුවත් එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (3) | ඉකුත් වූ තැන්පතු අදාල ආදායම් ගිණුමට හෝ රජයේ ආදායමට බැර කළ යුතු නමුත්, රු.789,136 ක වෙක්පත් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |
| (ඇ) | 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | විදේශ ගමන් සඳහා ගුවන් යානාපත් සෑම විටම මිලදී ගැනීම අනුමත සමාගම් වලින් පමණක් සිදුකල යුතු වුවද ඊට පටහැනිව පුද්ගලික ආයතන වලින් රු.1,562,400 ක් වටිනා ගුවන් යානා පත්‍ර මිලදී ගෙන තිබුණි. |
| (ඈ) | 2001 අප්‍රේල් 04 දිනැති අංක 91 දරන අයවැය චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව ක්‍රීඩා අමාත්‍යවරයාගේ පෞද්ගලික සහකාර වශයෙන් කටයුතු කළ නිළධාරියකුගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් රු.750,297 ක් ක්‍රීඩා අරමුදලින් වැයකර තිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේදී, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු කායවර්ධන මධ්‍යස්ථානයේ රු.1,681,061 ක ආදායම් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ජාතික ක්‍රීඩා අරමුදලට බැර කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,061,490 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,468,672 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.27,530,162 කින් වර්ධනය වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ජාතික මහා ක්‍රීඩා උළෙලේ වියදම් හා විවිධ ගෙවීම් පිළිවෙලින් රු. 5,725,000 කින් හා රු.20,842,631 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා වලට ධෛර්යය දීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම අරමුදලේ ප්‍රධාන අරමුණු වුවත් අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා සංයුක්ත සැලැස්මක් සහ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යුත් ලකුණු පුවරුවක් මිලදී ගැනීම සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට ලබාදීමට අරමුදලට අයත් රු.3,000,000 ක ස්ථාවර තැන්පතුව 2013 අගෝස්තු මාසයේ ඉවත් කරගෙන තිබූ නමුදු අධිකාරියට ලබා නොදී ජංගම ගිණුමක තබා ගැනීම හේතුවෙන් අරමුදලට ලබාගතහැකිව තිබූ ස්ථාවර තැන්පතු පොලී ආදායම අහිමි වී තිබුණි.

(ආ) 2014 ජූනි මාසයේදී ක්‍රීඩා අමාත්‍යවරයා විසින් රු.15,000,000 ක මුදලක්, රු.5,000,000 ක් බැගින් වූ ස්ථාවර තැන්පතු තුනක ආයෝජනය කිරීමට අනුමැතිය ලබාදී තිබුණද රු.5,000,000 ක මුදලක් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රීඩා භාණ්ඩ කට්ටල 2,500 ක් බෙදාදීමේ වැඩ සටහනකට ක්‍රීඩා සමාජ සාමාජිකයින්ට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා දකුණු හා වයඹ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශවලට පිළිවෙලින් රු. 900,000 ක් හා රු. 717,000 ක් ක්‍රීඩා අරමුදලෙන් වැයකර තිබුණද ක්‍රීඩා භාණ්ඩ කට්ටල 10 ක් පමණක් බෙදා දී තිබුණි. නැවත රු.28,600 ක ප්‍රවාහන වියදමක් දරා ක්‍රීඩා භාණ්ඩ කට්ටල 900 ක් පළාත් අමාත්‍යාංශ වෙත ප්‍රවාහන කර තිබුණි. ඒ අනුව මෙම වැඩ සටහන වෙනුවෙන් වැයකරන ලද රු.1,617,000 ක ප්‍රවාහන වියදම හා රු.125,000 ක උත්සව වියදම් නිශ්ඵල වියදමක් වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 11.1 වගන්තිය ප්‍රකාරව විදේශගත වීමේදී පිරිමැසුම් පංතියක ගමන් කළ යුතු වුවත් ඊට පටහැනිව ව්‍යාපාරික පංතියේ යානා පත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් රු.1,800,700 ක් වැය කර තිබුණි.

### 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 27 වන ඡේදය මගින් ක්‍රීඩා අරමුදල් භාවිතා කළ හැකි අරමුණු නිශ්චිතව දක්වා ඇතත් ඊට පටහැනිව අමාත්‍යාංශ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2013 හා 2014 වර්ෂ වලදී රු.35,000,000 ක් වැය කර තිබුණි.

(ආ) ජාතික සුගතදාස ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය මගින් පාලනය වන බෝගම්බර ක්‍රීඩාංගණයේ කාය වර්ධන මධ්‍යස්ථානයට බඳවාගෙන තිබූ උපදේශකයින් තිදෙනෙකු, අමාත්‍යාංශයේ පිළිගැනීමේ නිළධාරි තනතුරට තාවකාලික පදනම මත බඳවාගෙන තිබූ නිළධාරියෙකු හා අනුමත තනතුරක් නොමැතිව අමාත්‍යාංශයට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ නඩත්තු ඉංජිනේරුවකුගේ වැටුප් හා දීමනා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 591,437ක් ජාතික ක්‍රීඩා අරමුදලින් ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ජාතික ක්‍රීඩා අරමුදලෙන් ක්‍රීඩා පුවත්පත් කලාවේදීන් හා රූපවාහිනී ක්‍රීඩා වාර්තාකරුවන් වෙනුවෙන් රු.1,065, 000 ක් වැයකර තල පරිගණක 30 ක් මිලදී ගෙන තිබුණි. මාධ්‍ය ආයතනයකට තල පරිගණකය බැගින් ලබාදීමට අමාත්‍යවරයා අනුමැතිය ලබාදී තිබියදී මාධ්‍ය ආයතන 05 කට තල පරිගණක දෙක බැගින් ලබාදී තිබුණි.

(ඈ) 2013 වර්ෂයේ පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුවේ සමාරම්භක උත්සවය හා ව්‍යාපාර සමුළුව සංවිධානය හා වියදම් දැරීම විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සිදුකර තිබියදී සමාරම්භක උත්සවයේදී ප්‍රචාරය කරන ලද BREAKFAST EVENT වැඩසටහන හා ඊට අදාල වෙනත් සහායක සේවාවන් ලබාගැනීම වෙනුවෙන් පුද්ගලික සමාගමකට ක්‍රීඩා අරමුදලෙන් රු.7,501,019 ක් ගෙවීමේ අවශ්‍යතාවය විගණනයට තහවුරු නොවීය. තවද අදාල වැඩසටහනේ ආලෝකකරණය, දර්ශන තල, ශබ්ද විකාශන යනාදී අවශ්‍යතාවයන් වෙනුවෙන් වෙන්කර තිබූ රු.1,895,262 ක ගාස්තුව අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි ඇගයීම් කිරීමේදී ඉවත්කර තිබියදීත් ඒ සඳහා ගෙවීම් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

**අභ්‍යන්තර විගණනය**

------------------------

ජාතික ක්‍රීඩා අරමුදලේ කටයුතු විගණනය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර ක්‍රීඩා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින්ද අරමුදලේ කටයුතු විගණනය කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) මූල්‍ය කළමනාකරණය
(ආ) ගිණුම්කරණය
(ඇ) අයවැය පාලනය